**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# ලංසු කැඳවීම සඳහා ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා අලුත්ම සහ පිළිගත් වෙළඳ නාමයකින් (Branded) යුත්

I. **ඩෙස්ක්ටොප් (Desktop) පරිගණක 55 ක් සහ**

II. **ලැප්ටොප් (Laptop) පරිගණක 12 ක්**

## සැපයීම, බෙදා හැරීම, සවිකිරීම, ක්‍රියාත්මක කිරීම (භාවිතයට සූදානම් කිරීම) සහ නඩත්තු කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය

## IFB අංකය : DIE/PRO/04/2026/17

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ඩෙස්ක්ටොප් (Desktop) පරිගණක 55 ක් සහ ලැප්ටොප් (Laptop) පරිගණක 12 ක් සැපයීම, බෙදා හැරීම, සවිකිරීම, ක්‍රියාත්මක කිරීම (භාවිතයට සූදානම් කිරීම) සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ පටිපාටිය (NCB) යටතේ සිදු කෙරේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලපරිච්ඡේදය තුළ අංක 0112-101519 දරන දුරකථනය ඔස්සේ ඇමතුම් ලබා ගැනීම තුළින් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය. 2026.07.08 දින සිට 2026.07.27 දිනය දක්වා කාලපරිච්ඡේදය තුළ 4 වන ඡේදයේ දක්වා ඇති ලිපිනය වෙත පැමිණ ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.immigration.gov.lk) වෙත පිවිසීම මගින් ද ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.07.08 දින සිට 2026.07.27 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රුපියල් දස දහසක (රු. 10,000.00) ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව, බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය", 05 වන මහලේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකි වේ. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

05. "මුල් පිටපත" (Original) සහ "අනුපිටපත" (Duplicate) ලෙස නිසිලෙස සම්පූර්ණ කරන ලද ලංසු වෙන වෙනම කවරවල බහා ඉන් අනතුරුව එම කවර එකම් කවරයක් බහා මෙම මුද්‍රා, තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවට අදාළ නම සහ IFB අංකය පැහැදිලිව දැක්විය යුතු අතර, මුද්‍රා, තැබූ ලංසු 2026.07.28 දින ප. ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ 4 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයට භාරදීම හෝ සිදු කළ යුතුය.

06. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම 2026.07.28 දින ප.ව. 2.00 ට 4 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. ලංසුව, ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දින සිට දින අනූ එකක් (91) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන, දීර්ඝ කරන ලද යම් දිනයක් දක්වා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය. සෑම ලංසුවක් සමගම, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද බැංකු ඇපකරයක ආකාරයෙන් වූ ලංසු සුරැකුමක් පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් ලබා දිය යුතුය.

| | | |
|---|---|---|
| ලොට් I | : | ශ්‍රී ලංකා රුපියල් පන් ලක්ෂයක් (රු. 500,000.00) |
| ලොට් II | : | ශ්‍රී ලංකා රුපියල් ලක්ෂයක් (රු. 100,000.00) |

08. 2026.07.15 දින පෙරවරු 10.00 ට බත්තරමුල්ල ශ්‍රී සුභූතිපුර පාරේ "සුහුරුපාය", 07 වන මහලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**